# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.26 පැය 2350 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/847/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අධිකරණ නියෝගයක් දැනුම් දීම.**

2025.04.27 වන හෙට දින විරෝධතාකරුවන් පිරිසක් මරදාන පොලිස් වසමේදී, උපාධිධාරීන් බඳවා ගැනීමට අදාලව පවත්වනු ලබන තරඟ විභාගයට සහභාගි වන අයදුම්කරුවන්ට ඒ සඳහා සහභාගි නොවන ලෙසට බලපෑම් කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් ඒකරාශී වී විරෝධතාවන් පැවැත්වීමට හා එම විභාග මධ්‍යස්ථාන වල ආරක්ෂාවට තර්ජනයක් වන පරිදි කඩාකප්පල්කාරී ක්‍රියාවන් සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇති බවට මරදාන පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සඳහන් වග උත්තරකරුවන් වන,

1. එම්.එන්.එම්. නුස්රි, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුව සම කැඳවුම්කරු (ගෙලිඔය, ගම්පොල)
2. නඳුන් දශරික හේවාපතිරණ, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුව ලේකම් (ඉසද නවම් මාවත, දකුණු මාතර, මාතර)
3. මධුෂාන් චන්ද්‍රජිත්, අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු (අංක 2/1 තෝරකොළයාය, මුල්ආඩියාවල, ඇඹිලිපිටිය)
4. රවී කුමුදේශ්, පරිපූරක වෛද්‍යසේවා වෘත්තීය සමිති ඒකාබද්ධ බලමණ්ඩලයේ සභාපති (881/01/01, මරදාන පාර, කොළඹ 10)

සහ ඔවුන්ගේ නියෝජිතයන් වෙත 2025.04.27 වන දින පැය 0800 සිට 2025.04.27 වන දින පැය 1600 දක්වා මරදාන පොලිස් වසමේ රෝහල් චතුරශ්‍රයට ඇතුළුවීම ඒ අවට පිහිටා ඇති රෝහල් වලට බාධා වන පරිදි ඩීන්ස් පාර, ද සේරම් පාර, කින්සි පාර, රිජන්ට් වීදිය පදික වේදිකා අහුරමින් සිදු කරන උද්ඝෝෂණ, පෙළපාලි හා සම සෞඛ්‍ය උපාධිධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගය පවත්වන විභාග මධ්‍යස්ථාන වන පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල කොළඹ 10 හා හෙද විදුහල, කොළඹ 10 ස්ථානයෙහි ඉදිරිපිට රැඳී සිටීම තහනම් කරමින් ආඥාවක් නිකුත් කර ඇත.

මෙම ආඥාව කඩ කිරීම ගරු අධිකරණය මඟින් දඬුවම් ලැබිය හැකි වරදක් වනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**